# බෞද්ධ භික්ෂූන් වහන්සේලා ලියූ නිසඳැස් පද්‍යවලින් හෙළිවන ධර්ම සංකල්පය (ආරම්භයේ සිට එක්දහස් නවසිය අනූව දක්වා)

## Dhamma Concepts Depicted in Nisades Poetry Written by Buddhist Monks

**පාතේගම ඤාණිස්සර හිමි**


**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සාහිත්‍ය ඉතිහාසය අධ්‍යයනය කර බලන විට පෙනී යන්නේ ආගමික සාහිත්‍යයක් පමණක් මෙහි පැවති බවයි. පසුව ශ්‍රී ලංකාවට නව සාහිත්‍ය අංග ඇතිවිය. එය සිදු වූයේ 1905 න් පසුව ය. එසේ පැමිණි නව සාහිත්‍ය අංගයක් ලෙස නිසඳැස් පද්‍ය කාව්‍යය හැඳින්විය හැකි ය. ආරම්භයේ සිට එක්දහස් නවසිය අනූව දශකය දක්වා බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතින් ලියවුණු නිසඳැස් කාව්‍යය විමසා බැලීමක් මෙම අධ්‍යයනය තුළින් සිදු වේ.



**යතුරුපදඃ** ආගමික සාහිත්‍යය, නව සාහිත්‍යය අංග, නිසඳැස් පද්‍ය, භික්ෂූන්, ධර්ම සංකල්ප.



**Abstract**

Sri Lankans had a literature from antient times, especially based on the religion. Later, new types of literatures were introduced after 1905. One of such new style of literature is the ‘Nisades poetry’ (Nisades Padya Kāvya). Thus, this study explores the Sinhala nisades poetry composed by Buddhist monks from the beginning of 1900s to the decade of 1990.



**Keywords:** Religious literature, New types of literature, Nisades poetry, Buddhist monks, Dharma concepts

**ප්‍රවේශය**

සිංහල සංස්කෘතික සමාජය මුල් කාලය තුළ වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ සාම්ප්‍රදායික සමාජ ක්‍රමයක් වශයෙනි. එම නිසාම මහින්දාගමනයේ සිට පැවති ආගමික හා සාහිත්‍යාත්මක ක්‍රම එලෙසින්ම අනුගමනය කරනු ලැබීය. බෞද්ධ භික්ෂූන් වහන්සේලා ද ශාසනික ප්‍රධාන කාර්යය ලෙස සලකනු ලැබ ඇත්තේ ආගමික සන්නිවේදනය සහ ආගමික සාහිත්‍යකරණයේ යෙදීමයි. දැඩි ලෙස සාම්ප්‍රදායික ආගමක් හැටියට බුදුසමය සහ පූර්ණ කාලීන බෞද්ධ ආගමිකයන් වූ භික්ෂූන් වහන්සේලා කටයුතු කරනු ලැබ තිබේ. ගී කාව්‍ය සහ පද්‍ය කාව්‍යකරණය පමණක් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ නිර්මාණ අතර දක්නට ලැබුණත් නිසඳැස් නැමැති නව සාහිත්‍යාංගය කෙරෙහි භික්ෂුවගේ දායකත්වය දක්නට නොලැබේ. අනුරාධපුර යුගයේ සිට සිංහල සාහිත්‍යයේ භික්ෂූන් වහන්සේලා නිරත වුව ද නිසඳැස් පද්‍ය කෙරෙහි උන්වහන්සේලා දැක්වූ උනන්දුව අල්ප ය. සිංහල සංස්කෘතික මහාසමාජය පද්‍යකරණය මහ ඉහළින් සැලකූ හෙයින් එකී අංශය කෙරෙහි භික්ෂුව නැඹුරු වී තිබේ. මුල් කාලය තුළ බහුල වශයෙන්ම භික්ෂූන් වහන්සේගේ සාහිත්‍යකරණයෙහිලා සිංහල මහාසමාජ ප්‍රවාහය විසින් යහපත් යයි අර්ථකථනය කළ විෂයන්හි පමණක් යෙදීමට බෞද්ධ භික්ෂුවගේ අභිමතය වී පැවති බව පෙනේ. කිසියම් සමාජ විරෝධයක් මතුවේදෝහෝයි සිතමින් වෙනස් වන සමාජය සමග නොවෙනස් වෙමින් කටයුතු කිරීමට උන්වහන්සේලා සැදී පැහැදී සිට ඇත. සාම්ප්‍රදායික භික්ෂුව කිසියම් ආකාරයකින් වෙනස්වනු දැකීම මහාසමාජයේ ද අපේක්ෂාව නොවී ය. එනිසා නව තාක්ෂණික සමාජය සමග පැමිණි බොහෝ සාහිත්‍යාංග බෞද්ධ භික්ෂුවගෙන් ප්‍රතික්ෂේප වී තිබේ. එයට ප්‍රධානතම හේතුව හැටියට දැක්විය හැක්කේ සිංහල මහාසමාජය සමග එකී මතයට ගරු බුහුමන් කරමින් කටයුතු කිරීමට බෞද්ධ භික්ෂුව දැක්වූ නම්‍යශීලීභාවය යි.

**නව සාහිත්‍යාංග**

එක්දහස් නවසියයේ සිදු වූ ලෝක සාහිත්‍ය ප්‍රවණතාවන් කුඩා රටවල්වලට ද පැතිරී ගියේ ය. ඒ අනුව එතුවක් ආගමික සාහිත්‍ය ලෙස පැවති සාහිත්‍ය සඳහා නව සාහිත්‍යාංග ඇතුළත් වන්නට විය. සිංහල රටට ද එම සාහිත්‍ය සංකල්ප පැමිණියේ ය. එම නව සාහිත්‍යාංග කිහිපයකි. එනම්,

- නවකතාව
- කෙටිකතාව
- නිසඳැස් පද්‍ය
- ගුවන්විදුලි ගීතය
- ගුවන්විදුලි ගීත නාටකය
- ගුවන්විදුලි නාට්‍ය
- චම්පු කාව්‍ය
- ස්වයං ලිඛිත චරිතාප්‍රදාන

මෙබඳු නව සාහිත්‍යාංග ශ්‍රී ලාංකේය සමාජයට පැමිණියේ ය. එම සාහිත්‍ය සංකල්ප තෝරා බේරා හඳුනා ගනිමින් ගිහි සමාජය විවිධ අත්දැකීම් ද ඇසුරු කරමින් සාහිත්‍ය පෝෂණය කිරීමේ නියැලුණහ. එහෙත් ලේඛක භික්ෂූන් වහන්සේලා එකී නව සාහිත්‍යාංග විෂයෙහි නොයෙදුණේ ඇතැම්විට සිංහල මහාසමාජය ද එබඳු සාහිත්‍ය නිර්මාණ බලාපොරොත්තු නොවූ හෙයින් විය යුතු ය. එක්කො භික්ෂුව ගිහියාගේ අවශ්‍යතාව පමණක් ඉටු කළහ. නැත්නම් භික්ෂුව පෙර පැවති සාහිත්‍යාංග පමණක් නිරත විය යුතු ඒවා යයි සිතූහ. භික්ෂුවගේ නව සාහිත්‍යාංග කරණයෙහිලා පැවති මන්දගාමී බව සිංහල සාහිත්‍යය වශයෙන් සිදු වූ මහත් අලාභයක් සේ දැකිය හැකි ය.

**නිසඳැස් කාව්‍යය : ආරම්භය**

ශ්‍රී ලංකාව තුළ නිසඳැස් පද්‍ය සම්ප්‍රදායේ ආරම්භකයා ලෙස සැලකිය හැකි වන්නේ ජී.බී. සේනානායකයන් ය. ඔහු සිය **පළිගැනීම** නම් වූ කෙටිකතා සංග්‍රහය තුළ නිසඳැස් ආකෘතියේ පද්‍ය කිහිපයක් පළ කරනු ලැබීය. එකී කාව්‍ය විශේෂය කෙරෙහි ශ්‍රී ලංකාව තුළ උනන්දුවක් ඇති වන්නේ මින් අනතුරුව ය. මහාචාර්ය සිරි ගුණසිංහ **මස් ලේ නැති** ඇට නැමැති කාව්‍ය සංග්‍රහයෙහිලා එකී සම්ප්‍රදාය ව්‍යාප්ත කරනු ලැබීය. මෙම කාව්‍ය සම්ප්‍රදාය සිංහල සාහිත්‍යයට අලුතින් සම්ප්‍රාප්ත

වූ එකක් නිසා ඒ පිළිබඳ විවිධ සාහිත්‍ය වාද විවාද ඇතිවන්නට විය. බෞද්ධ භික්ෂුව නිසඳැස් කාව්‍යකරණයට පැමිණෙන්නේ සමාජය තුළ පැවති එකී සියලු සාහිත්‍ය වාද විවාද අවසන් වී යාමෙන් පසුව බව නිසඳැස් පද්‍ය සාහිත්‍ය අධ්‍යයනය කරන්නෙකුට ඉතා පැහැදිලි කාරණාවකි. වර්තමානයේ වුව ද නිසඳැස් පද්‍ය පිළිබඳව වරින්වර සාකච්ඡා කරනු ඇසුණත් එහි ආරම්භය පිළිබඳව හා ඒ ගැන විමර්ශන සාකච්ඡා නැති තරම් ය. බෞද්ධ භික්ෂූන් වහන්සේගේ නිසඳැස් කාව්‍ය මෙහෙවර පිළිබඳව නම් මෙතෙක් කෙරුණු කිසිම සාකච්ඡාවක් සිදු වී නොමැති බව අවධාරණය කළ හැකි ය.

**නිසඳැස් කාව්‍යය : භික්ෂුව**

සිංහල සාම්ප්‍රදායික සමාජය තුළ භික්ෂුවගේ කාර්යභාරයේ ප්‍රවණතා ඇති වූ දශකයක් ලෙස හැත්තෑව දශකය දැක්විය හැකි ය. ඒ සඳහා ආර්ථික, සාමාජික මෙන් ම දේශපාලනික හේතු ද තිබේ. බෞද්ධ භික්ෂුව විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යොමු වීම, ගුරු වෘත්තිය වැනි රැකියාවලට යොමු වීම, විශේෂයෙන් තරුණ භික්ෂුව ගිහියන් අනුකරණය කරන්නට ගැනීම, ඒ අනුව සමාජ විප්ලව කෙරෙහි නැඹුරු වීම වැනි සමාජ කාරණා ද දැක්විය හැකි ය.

නිසඳැස් පද්‍ය සම්ප්‍රදායෙහි ආදිකම්මික භික්ෂුව කවුදැයි සොයන්නට යාම එතරම් ලෙහෙසි පහසු කාරණාවක් නොවුණත් එකී කාර්යයෙහි නිරත තරුණ භික්ෂූන් කිහිප නමක් ම හැටේ දශකයේ අග හරියේ සහ හැත්තෑව දශකයෙන් සොයාගත හැකි ය. අත්තනගල්ලේ පඤ්ඤාසෝම හිමි, කොස්ගොඩ සිරි සුධම්ම හිමි, කෝ. ආනන්ද හිමි, උණලියේ චන්ද්‍රසිරි හිමි, රිදීගම පියනන්ද හිමි, දොම්පේ සිද්ධාර්ථ හිමි, දොඹෙමඩ චන්දජෝති හිමි, අලුත්වල සුමනරතන හිමි, මුවඇටගම ආනන්ද හිමි, කන්දේගෙදර සද්ධාසාගර හිමි, විලේගොඩ අරියදේව හිමි, බේරුවල සංඝතිස්ස හිමි, සියඹලාගොඩ ප්‍රේමසිරි හිමි, බඳගිරියේ මේධානන්ද හිමි යන අය ඒ අතර ප්‍රධාන වේ.

නිසඳැස් පද්‍ය සම්ප්‍රදාය බෞද්ධ භික්ෂුවගෙන් ගිලිහී යාමට නොදෙමින් එය සමාජ අර්ථය කෙරෙහි සහ නිර්මාණාත්මක බවෙහි රඳවමින් දීර්ඝකාලීනව එහි නිරත වූ බෞද්ධ භික්ෂුවක හැටියට කෝ. ආනන්ද හිමියන් හැඳින්විය හැකි ය. උන්වහන්සේ නිසඳැස්

පද්‍ය සම්ප්‍රදායේ ආදිකම්මිකයා වශයෙන් දැක්වීමට සුදුසු ය. එසේ වන්නේ උන්වහන්සේ ලියා පළකළ නිසඳැස් පද්‍ය නිර්මාණ කෘති අධ්‍යයනය කර බලන විට දී ය. උන්වහන්සේ ලියූ නිසඳැස් පද්‍ය සංග්‍රහ ප්‍රමාණාත්මක අතින් ද වැඩි ය. උන්වහන්සේ මේ වන විට ලියා ඇති නිසඳැස් පද්‍ය කෘති සංඛ්‍යාව දහයකට ආසන්න ය. එම කෘති දශක හයක් පුරා පැතිරී යයි. කෝ. ආනන්ද හිමියන් මෙතෙක් ලියා ඇති නිසඳැස් කෘති :

- මා නිසා ඈ වීතරාගී - 1968
- ඈ හමුවුණි මෙසේ මැවුණි - 1969
- අම්මයි මමයි - 1973
- අලුත් ඉස්කෝලය - 1974
- නොනැවතී ඉදිරියට - 1975
- උරුමය සොයා - 1976
- නව කැලණි පාලම - 1982
- මහ පොළොව අලුත් කිරීම - 1994
- මාගේ දේශය අවදි කරමු - 1997
- කොරෝනා කාලේ කවි - 2021

කෝ. ආනන්ද හිමියන්ගේ **මා නිසා ඈ වීතරාගී** කෘතිය පළ වන්නේ එක්දහස් නවසිය හැට අටේ දී ය. මහගමසේකර විසින් අඳින ලද පිටකවරයකින් යුක්ත මෙහි පද්‍ය පංති විසි හයකි. ''නූතන සිංහල පද්‍යයේ ඉදිරි ගමන අවිනිශ්චිත තත්ත්වයකට පත්ව තිබෙන අවස්ථාවක එළි දැක්වීමට හැකි වූ මගේ කුළුඳුල් නිර්මාණයෙන් පද්‍යයේ අනාගතයටත් සහෘදයාටත් අල්පමාත්‍ර ආශීර්වාදයක් වේ නම් එයම උසස් ප්‍රීතියක් කොට සලකමි'' යනුවෙන් අදහස් දක්වා කතුවරයා කෘතියේ පළමුව ත්‍රිවිධ රත්නය වෙන වෙනම වන්දනාවක යෙදෙයි.

සුන්දරී නන්දා ථේරී ගාථා ඇසුරින් ''ඔබත් නන්දාවෙනි එසේම ය'' යනුවෙන් කරන ප්‍රතිනිර්මාණය අතිශයින් බෞද්ධාගමික අතින් ජීවිතයේ යථාර්ථය සිහි කැඳවයි.

දිරිමත් වූ තාරුණ්‍යය

ඔදවත් වූ තාරුණ්‍යය

දරදඬු වූ තාරුණ්‍යය

ජීවිතයේ ජරාභාවයේ යථා තතු පිට - 05

ථෙරී ගාථා ඇසුරින් රචනා කරන ලද ''**එයින් මම බමුණෙක් වෙමි**'' නැමැති පද්‍ය පංතිය බෞද්ධාගමික ජීවන යථාර්ථය කියාපාන කැඩපතක් වැන්න. පද්‍ය පංති තිස් හයකින් සමන්විත ඈ හමුවුණි මෙසේ මැවුණි නැමැති කාව්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය හැට නවය වසරේ ය. එහි පෙරවදනෙහිලා උන්වහන්සේ ''කායික වේදනාවක් නිසා උපන් දුක්ඛ සමුදාය හද තුළින් ඉවත් කර ගැනීමට ජන කවියා සමීප කරගත්තේ බෞද්ධ සම්ප්‍රදාය විසින් අවබෝධ කරවන ලද හැඟීම් මාලාවක් ය'' යනුවෙන් දක්වති. ධම්මපදයේ සහස්ස වග්ගය ඇසුරින් රචනා වූ ''සංග්‍රාමය'' නැමැති නිර්මාණය සංසාරය දිනීමේ අනගිකම පෙන්වයි.

දස දහසක් දෙන මා දිනුවා

දස දහසක් දෙන මා මැරුවා

දස දහසක් දෙන මා දිනුවා

දිනුවා මා දිනුවා පිට - 83

සංසාරයේ පුද්ගලයා නොතිත් ආශාවන් ඔස්සේ දිව ගොස් හුදකලා වේ. කොතරම් ආශා පොදි බැඳ ගත්ත ද එහි ඇති වීමක් ද දක්නට ලැබෙන්නේ නැත. අවසන තනිවීම පමණක් උරුම වේ.

එනවා යනවා අප මේ පාරේ

නිරන්තරේ නොම තේරේ

කොහි සිට එන්නේ

කොතැනක යන්නේ

නිරන්තරේ හමු වෙනවා

වෙන් වෙනවා පිට - 46

''**අම්මයි මමයි**'' නැමැති නිසඳැස් පද්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය හැත්තෑ තුනේ දී ය. එහිලා ''නිර්මාණය පහසු කාර්යයක් නොවේ. එහි ඇති වැදගත්කම බැරෑරුම්කම මැනවින් වැටහෙන්නේ ලේඛකයාට පමණි'' යනුවෙන් දක්වන රචකයා සමාජයේ විවිධ අංශ කෙරෙහි පැතිරුණු කවිත්වයක් පෙන්නුම් කරනු ලබයි. ''සමාධි - පිට 83, භක්ති - පිට 26, අවුකන බුදු පිළිම වහන්සේ - පිට 03 වැනි පද්‍ය බෞද්ධාගමික ධර්ම සංකල්පය හෙළි පෙහෙළි කිරීමට ගත් උත්සාහයක් වැන්න.

**නොනැවතී ඉදිරියට** කෘතිය පළ වන්නේ එක්දහස් නවසිය හැත්තෑ පහේ වසරේ දී ය. පද්‍ය පංතීන් විසි තුනකින් සමන්විත මෙහි දැක්වෙන මා නිවත්ත අභික්කම යන ධර්ම පාඨය ඇසුරින් නිර්මාණය වූ නොනැවතී ඉදිරියට - පිට 09, නැමැති පද්‍ය පංතිය ම.නි. අලගද්දූපම සූත්‍රය ඇසුරින් රචනා වූ ගමන - පිට 10, නලිනි ජාතකය ඇසුරින් රචනා වූ මගේ මළගම සහ මා - පිට 34 යන නිර්මාණ විශේෂ කොට දැක්විය හැකි ය. **උරුමය සොයා** නැමැති පද්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය හැත්තෑ හය වර්ෂයේ දී ය. එම කෘතියේ අවුකන බුදු හිමිට විරිඳු - පිට 43 නැමැති පද්‍ය සංග්‍රහය විශේෂ වෙයි.

**මහපොළොව අළුත් කිරීම** නැමැති කාව්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය අනූ හතර වර්ෂයේ ය. මෙම කෘතියට ආචාර්ය ඩබ්.ඒ. අබේසිංහ මහතා සිංහල කවියේ නව මුහුණුවර යනුවෙන් දීර්ඝ පෙරවදනක් සපයයි. කෘතිය පද්‍ය පංති හැටහතරකින් සමන්විත ය. එහි සඳහන් නිසඳැස් කාව්‍ය පංති අතර ගෙදර බුදුන් අම්මේ - පිට 33, බුදු අම්මේ - පිට 54, සිංහරාජ අඩවියේ ලේ උරා බොන වවුලෝ - පිට 73, සාමය මිනිසාමයි - පිට 86, ලොකු හාමුදුරුවෝ බනින්නේ

නෑ - පිට 126 යන කාව්‍ය විශේෂ වේ. ඒවා විශේෂ වන්නේ බුදුසමයේ උගන්වන ධර්ම සංකල්පය සමාජගත කිරීමට එම නිර්මාණ තුළින් ගෙන ඇති උත්සාහය නිසා ය.

**මාගේ දේශය අවදි** කරමු කාව්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය අනූ හත වර්ෂයේ දී ය. පුංචිබණ්ඩා ඒකනායක විසින් ලියන ලද දීර්ඝ ලිපියක් ද එම කෘතියට ඇතුළත් ය. පද්‍ය පංති හැත්තෑවකින් පමණ සමන්විත ය. කෘතියේ පෙරවදනෙහිලා උන්වහන්සේ සඳහන් කරනු ලබන්නේ ''විසිවන සියවසේ මැද භාගයේ සිටම විවිධ කලාකරුවන් කරනු ලැබ තිබෙන්නේ අතීතයේ මහා ප්‍රාඥයන් දායාද කළ සාරධර්ම විවිධ ක්‍රමවලින් පුනරුච්ඡාරණය කිරීම පමණකි'' යනුවෙන් ය. මෙම කෘතියේ පද්‍ය පංතිවලින් ගුරු පියාණනි - පිට 53, ගමේ පන්සල - පිට 77, පන්සල පල්ලිය, කෝවිල ළඟ - පිට 91, අපි කුසිනාරාවට යමු ආනන්ද - පිට 121, ලොකු හාමුදුරුවෝ හාන්සි පුටුවේ නෑ - පිට 127 වැනි කාව්‍ය පංතිවලින් ධර්ම සංකල්ප සමාජයට දීමට ගනු ලැබූ උත්සාහය ප්‍රශංසනීය යි.

**කොරෝනා කාලේ කවි** කෘතිය පළවන්නේ දෙදහස් විසිඑක වර්ෂයේ දී ය. කාව්‍ය පංති එකසිය තිස්පහකින් මෙම කෘතිය සමන්විත ය. ''මානව වර්ගයාගේ විමුක්තිය උදෙසාම බුදුන් වහන්සේ දේශනා කළ විශ්ව සාධාරණ ත්‍රිලක්ෂණයට දැනි දැනී හැඟි හැඟී මැවි මැවී පිළිබිඹු වූයේ අසිරිමත් දැක්මක් ද කොරෝනා කාලේ කවි ඒ සිත් ගැබින් බිහි විය'' යනුවෙන් කෝ. ආනන්ද හිමියෝ කෘතියේ තුතිමල් ඉති නම් වූ පෙරවදනෙහි සඳහන් කරති. කෘතියේ තෙරුවන් වෙනුවෙන් නිර්මාණ තුනක් ආරම්භයෙහි දී ම සඳහන් කරනු ලැබ තිබේ. එම කෘතියේ සඳහන් වන දහමට සරිකොට - පිට 16, රුක් වළප - පිට 115 වැනි කාව්‍ය බෞද්ධ ආගමික ධර්ම සංකල්පය ව්‍යාප්ත කිරීම අරමුණු කරගෙන පද බැන්ද නිර්මාණ සේ ය. කෘතිය අවසන් කරනු ලබන්නේ සිව් පදයකින් ය.

හදගත් සිතුම් ගෙතුමින් පිපි අරවින්ද
සතපත් විපත් හද පිදූ දම් මකරන්ද
නමයුත් කොරෝනා කාලේ කවි බැන්ද
බුදුපුත් වෙමින් කිවියර කෝ. ආනන්ද

පිට 135

කොස්ගොඩ සිරි සුධම්ම හිමියන්ගේ **අරටු** නැමැති නිසඳැස් පද්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය හැටදෙක වර්ෂයේ ය. එනම්, කෝ. ආනන්ද හිමියන්ගේ පළමු නිසඳැස් කාව්‍ය කෘතිය වන මා නිසා ඈ වීතරාගී කෘතිය පළ වීමට වර්ෂ හතකට පෙර ය. කෘතියේ පෙරවදන සපයන කතු හිමියන් ''විවිධත්වය තුළ ඒකත්වයත්, ඒකත්වය තුළ විවිධත්වයත් දැකීම කවියකට නම් අමාරු දෙයක් නොවෙයි'' යැයි සඳහන් කරනු ලැබ තිබේ. කෘතිය ගැන සටහනක් තබන ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයෝ ''කොස්ගොඩ සිරි සුධම්ම හිමියන් විවිධ රුචිකත්වයෙන් ලොව හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් තරුණ ජීවිතයේ දී ම කිවිත්වයට පිවිසීමේ පින ලබාගත් බව පෙනේ. උන්වහන්සේගේ බසෙහි මිහිර ඉවකොට ගෙන පද්‍යයට හුරුකර ගැනීමෙහි සමත් ය. පිට - 06'' යනුවෙන් දක්වති. කෘතියේ පද්‍යවලට අමතරව සඳ කුමරු නම් ගීත නාටකයක් ද වේ.

අත්තනගල්ලේ පඤ්ඤාසෝම හිමියන්ගේ නිසඳැස් පද්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය හැත්තෑපහ වර්ෂයේ ය. උන්වහන්සේ එක්දහස් නවසිය හැත්තෑතුන වර්ෂයේ **රිදී පවුරකින්** නම් පද්‍ය සංග්‍රහයක් ලියා පළ කළහ. එම කෘතියෙන් ලද රසික සහයෝගය ගැන උන්වහන්සේ දක්වන අදහස් මෙබඳු ය. ''මගේ කුළුඳුල් කාව්‍ය සංග්‍රහය වූ රිදී පවුරකින් කියවූ රසිකයන්ගෙන් ලැබුණු සහයෝගය නිසා ''**දත් කැකුළු පාලා**'' ලිවීමට මම සමත් වීමි. වර්තමානයේ කවිය ගැන පවත්නා දැඩි උනන්දුව මේ කාර්යයෙහිලා මා පෙළඹවීමේ තවත් රුකුලක් විය යනුවෙන් ය. රිදී පවුරෙහි කවි පිළිබඳව විචාරයක යෙදෙන ඒ.වී. සුරවීර දක්වන්නේ ''අපේ බොහෝ තරුණ කවීන් මෙන් ප්‍රේමාලාප ලිවීම පසෙක ලා ලේඛකයෙකුගේ වගකීම පිළිබඳව නියම අවබෝධයකින් යුක්තව කවි ලිවීමට ගත් තැතක් වශයෙන් මම

රිදී පවුරකින් අගය කරමි. එහි එන කවි පන්ති වැඩි ගණනකින්ම ජීවිතය පිළිබඳ නියම තත්ත්වය තේරුම් ගැනීමට රසිකයා යොමු කරවයි'' යනුවෙන් ය. එක්දහස් නවසිය හැත්තෑ තුනේ දිනමිණ පත්‍රයේ ''කාව්‍ය සංග්‍රහයක් වන මෙහි පළකළ අදහස් මෙයට ඇතුළත් වේ. සඳැස් මෙන්ම නිසඳැස් රීතියෙන් ද පද්‍ය පන්ති රැසක් මෙහි ඇත යනුවෙන් දක්වයි.

අත්තනගල්ලේ පඤ්ඤාසෝම හිමියන් ලියූ ''**දත්කැකුළු පාලා**'' නම් පද්‍ය සංග්‍රහයේ පද්‍ය නිර්මාණ විසි අටක් පමණ දක්නට ලැබේ. එයිනුත් බලාපොරොත්තුවක් - පිට 04, අංජලී කරණීයෝ - පිට 13, ධම්මපදයක් - පිට 22, ජනකවි හතරක් - පිට 23, පබ්බතට්ඨොව බුම්මට්ඨෙ - පිට 27 වැනි පද්‍ය නිර්මාණ ප්‍රස්තුතයෙහිලා ප්‍රමුඛතර ය. උන්වහන්සේගේ කාව්‍ය නිර්මාණ පිළිබඳව අදහස් දක්වන මහාචාර්ය සුනිල් ආරියරත්න ''කලා සීමාවන් ආරක්ෂා කරගනිමින් වර්තමාන ප්‍රශ්න නිරීක්ෂණය කිරීම බැරෑරුම් වූත් සියුම් වූත් කාර්යයකි. අත්තනගල්ලේ පඤ්ඤාසෝම නමැති කාව්‍යකාරයා මෙම දුර්ග මාර්ග යේ ගමන් කිරීමට උත්සාහ ගනියි'' යනුවෙන් දක්වයි.

මුවඇටගම ආනන්ද හිමියන් සහ මහින්ද චන්ද්‍රසේකර එකතුව **කමටහන් අමතකය** යනුවෙන් නිර්මාණ සංග්‍රහයක් පළ කරනු ලබන්නේ එක්දහස් නවසිය හැත්තෑ අට වර්ෂයේ ය. එම කාව්‍ය සංග්‍රහයේ කවියන් දෙදෙනාගේ කාව්‍ය නිර්මාණ මොනවාදැයි වෙන්කොට දක්වා ඇත. එම කෘතියට පෙරවදන සපයන විමල් දිසානායක දක්වන්නේ ''මෙම කාව්‍ය සංග්‍රහයෙහි සිත් ගත් ලක්ෂණයක් නම් එදිනෙදා ජීවිතයේ ඇස ගැටෙන සුලභ වස්තූන් හා දර්ශන ජීවිත සත්තාව ප්‍රකට කරවන සංකේත ලෙස පරිහරණය කිරීමට උත්සාහ කොට තිබීමයි'' යනුවෙන් ය. මුවඇටගම ආනන්ද හිමියන්ගේ නිර්මාණ අතර ඇත්තේ කඳුළු - පිට 09, අඩ්ඩකාසි - පිට 12, තොටියා - පිට 15, පසුර - පිට 19, කෝනුහාසෝ කිමානන්දෝ - පිට 30 වැනි නිර්මාණ ප්‍රස්තුත විෂයෙහිලා ප්‍රශස්ත ය.

විලේගොඩ අරියදේව හිමියන් ලියූ **විරහ ගීතයක් නොවෙයි** නිසඳැස් කාව්‍ය සංග්‍රහය පළවන්නේ එක්දහස් නවසිය හැත්තෑ හතරේ දී ය. එය ඉතාමත් කුඩා වූ පොත් පිංචකි. ඉන්පසුව උන්වහන්සේ ''**උණුදිය උල්පත**'' නමින් කවි කොළයක් සංස්කරණය කරනු ලැබීය.

## සමාලෝචනය හා නිගමනය

නිසඳැස් පද්‍ය සම්ප්‍රදාය ශ්‍රී ලාංකේය සාහිත්‍ය සම්ප්‍රදායට විදේශීය සාහිත්‍ය බලපෑම සහ සාහිත්‍ය සම්ප්‍රදායට විදේශීය සාහිත්‍ය බලපෑම සහ සමාජ ගෝලීයකරණය නිසා පැමිණි නව සංකල්පයක් වශයෙන් අදහස් කළ හැකි ය. ශ්‍රී ලංකාව තුළ පැවති මහාසම්ප්‍රදාය තුළ ථෙරවාද භික්ෂූන් වහන්සේ රැඳෙමින්ම එය ආරක්ෂා කළා මිස නව සාහිත්‍ය සම්ප්‍රදායන් අනුගමනය කිරීමට පෙළඹෙන්නේ බොහෝ කාලයකට පසුව ය. සිංහල ගිහි සමාජයට සාහිත්‍යය භික්ෂුවට කැප යයි අනුමත කරනු ලැබුව ද විදේශයෙන් පැමිණි නව සාහිත්‍යය සංකල්පයකට පවා භික්ෂුව උනන්දු වනු දැකීම ප්‍රිය නොකළේ ය. භික්ෂූන් වහන්සේ ද ගිහි සම්ප්‍රදායට අවනත වී තිබේ. නිසඳැස් පද්‍ය සම්ප්‍රදායෙහි නිරත වීම සඳහා භික්ෂූන් වහන්සේගේ ආගමනය ප්‍රමාද විය. එසේ වුව ද උන්වහන්සේලා නිසඳැස් පද්‍ය ආකෘතිය තුළ රැඳෙමින් වුව ද බුදුසමයේ එන ධර්ම සංකල්ප සමාජගත කිරීමේ උත්සාහය අත් නොහළ බව පෙනේ.

## මූලාශ්‍රය


අරියදේව හිමි, විලේගොඩ. (2010) උල්පත් දෙකක්. අම්බලන්ගොඩ. කර්තෘ ප්‍රකාශන.

ආනන්ද හිමි, කෝ. (1968) මා නිසා ඈ වීතරාගී. නුගේගොඩ. දීපානි මුද්‍රණ ශිල්පියෝ.

ආනන්ද හිමි, කෝ. (1969) ඈ හමුවුණි මෙසේ මැවුණි. නුගේගොඩ. දීපානි මුද්‍රණ ශිල්පියෝ.

ආනන්ද හිමි, කෝ. (1973) අම්මයි මමයි. නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ.

ආනන්ද හිමි, කෝ. (1974) අලුත් ඉස්කෝලය. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

ආනන්ද හිමි, කෝ. (1975) නොනැවතී ඉදිරියට. කොළඹ. ප්‍රදීපා ප්‍රකාශකයෝ.

ආනන්ද හිමි, කෝ. (1976) උරුමය සොයා. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

ආනන්ද හිමි, කෝ. (1982) නව කැලණි පාලම. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

ආනන්ද හිමි, කෝ. (1994) මහපොළව අලුත් කිරීම. කොළඹ. ගොඩගේ ප්‍රකාශකයෝ.

ආනන්ද හිමි, කෝ. (1997) මාගේ දේශය අවදි කරමු. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

ආනන්ද හිමි, කෝ. (2021) කොරෝනා කාලේ කවි. නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ.

ආනන්ද හිමි, මුවඇටගම/චන්ද්‍රසේකර මහින්ද. (1978) කමටහන් අමතකය. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

ආනන්ද හිමි, මුවඇටගම. (1976) රෑ රගමඩල සහ කණ කෙකිනිය. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

චන්ද්‍රසිරි, උණලීයේ/සිරි ගුණවර්ධන නිහාල්. (1979) සංකල්පනා. කැලණිය. කැලණිය වි.වි.

චන්ද්‍රසිරි, උණලීයේ/සද්ධාසාගර, කන්දෙගෙදර. (1974) කෙම්බිම. කුලියාපිටිය. කර්තෘ ප්‍රකාශන.

පඤ්ඤාසෝම හිමි, අත්තනගල්ලේ. (1973) රිදී පවුරකින්. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

පඤ්ඤාසෝම හිමි, අත්තනගල්ලේ. (1975) දත් කැකුලු පාලා. කොළඹ. කර්තෘ ප්‍රකාශන.

සිරි සුධම්ම, කොස්ගොඩ. (1962) අරටු. කොළඹ. කේ. සෑම්. විජයානන්ද ආබෲ.